# කළමනාකරණ කමිටු රැස්වීම.

දිනය - 2017.08.21

වේලාව - පෙ.ව. 09.00

ස්ථානය - ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)

මූලාසනය - **එම්.ඒ.බී. දයා සෙනරත් මයා (ප්‍රධාන ලේකම් - බ.ප.)**

සහභාගී වූ නිලධාරීන්,

- **ඩබ්ලිව්. එම්. දයාවතී මිය.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)**
- **ඩී.එම්.එන්. දිසානායක මිය.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)**
- **ඩබ්ලිව්.එම්.ඩී.එන්.රණසිංහ මයා.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)**
- **චම්පිකා පතිරණ මිය.**
  **ප්‍රධාන අභ්‍යන්තර විගණක**
- **සුනේත්‍රා පතිරත්න මිය.**
  **අධ්‍යක්‍ෂ (අයවැය)**
- **ටිෂානි රාමනායක මිය.**
  **අධ්‍යක්‍ෂ (සැලසුම්)**
- **පී. කණිෂ්ක ශ්‍රී ලාල් මයා.**
  **සහකාර ප්‍රධාන ලේකම් (පාලන)**
- **කේ.එන්.සූරියආරච්චි මිය.**
  **සහකාර ප්‍රධාන ලේකම් (පාලන)**
- **සිරිසෝම ලොකුවිතාන මයා.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)**
- **එන්. බන්දුල ප්‍රේමකුමාර මයා.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)**
- **ජී.ඒ.එන්. ජයන්ත මයා.**
  **ආදායම් කොමසාරිස් (බ.ප)**
- **නිශාන්ති විජේසුන්දර මිය.**
  **අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්)**
- **එම්.ඩබ්ලිව්.එස්.කුරේ මයා.**
  **අධ්‍යක්ෂ (අදායම් හා මුදල්)**
- **ජී.ඩබ්ලිව්.පී. පෙරේරා මිය.**
  **අධ්‍යක්ෂ (ඉංජිනේරු)**
- **එල්.ඒ.බී.එල්,ගුණසේකර මිය.**
  **ප්‍රධාන ගණකාධිකාරී (ඉංජිනේරු)**
- **කේ.ඩී.වයි. බිමාලි මිය.**
  **සහකාර ප්‍රධාන ලේකම් (පිරිස්)**
- **ඊ.බී.වින්ධ්‍යානි මිය.**
  **සහකාර ප්‍රධාන ලේකම් (පුහුණු)**

## සාකච්ඡා කරන ලද කරුණු

### පාලන අංශය

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | ශ්‍රාවස්ති පරිශ්‍රය ඩෙංගු මදුරුවන්ගෙන් තොර කලාපයක් බවට පත් කිරීම. | ඩෙංගු රෝග ව්‍යාප්තිය මර්දනය කිරීම වෙනුවෙන් ශ්‍රාවස්ති පරිශ්‍රය තුල ඩෙංගු මදුරුවන් බෝ වන ස්ථාන නිරීක්ෂණය කිරීම සඳහා සෑම සිකුරාදා දිනක ම උදෑසන 9.30ත් 10.30ත් අතර සියලුම ආයතන ප්‍රධානීන් නිරීක්ෂණ චාරිකාවක් යාම සහ එම ස්ථාන පිරිසිදු කරලීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 02. | හෝමාගම ගබඩාවත්ත කෘෂිකර්ම පුහුණු භූමියෙන් මධ්‍යම පාන්තික නිවාස සංකීර්ණයක් සඳහා ඉඩම් කොටසක් වෙන් කර ගැනීම. | මෙම නිවාස සංකීර්ණයට අදාල ව ගොඩනැගිලි සැලසුම් ඉංජිනේරු අංශය මගින් සකස් කර ඇති බවත්, ඉඩම පවරා ගැනීමට අදාල ව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය ලේඛන සකස් කරමින් පවතින බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) පවසන ලදී.<br>එසේම, මෙම ඉඩම අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ වර්තමාන තත්ත්වය සම්බන්ධව ඉඩම් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් සමඟ සාකච්ඡාවක් කැඳවන ලෙසත් ප්‍රධාන ලේකම් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |

### පිරිස් හා පුහුණු අංශය

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ තොරතුරු තාක්ෂණ අංශය වෙනුවෙන් නව “සහකාර අධ්‍යක්ෂ” තනතුර | නව “සහකාර අධ්‍යක්ෂ” තනතුර වෙනුවෙන් සුදුසු පුද්ගලයකු බඳවා ගැනීම සම්බන්ධව වර්තමාන ප්‍රගතිය විමසූ අතර, තොරතුරු තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුමැතිය සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යවා ඇති බව ප්‍රකාශ කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 02. | රියදුරන් සහ වාහන හිමි මාණ්ඩලික නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම. | ආණ්ඩුකාරතුමාගේ නිර්දේශ පරිදි ප්‍රධාන ලේකම් විසින් ලබා දුන් උපදෙස් අනුව, රියදුරන් සඳහා ප්‍රායෝගික පුහුණුව ද ඇතුළත් ව සංවිධානය කරන ලද පුහුණු සැසිය, අගෝස්තු මස 01 වන දින පැවැත්වීමට කටයුතු යොදා ඇති බව සහකාර ප්‍රධාන ලේකම් (පිරිස්) විසින් දන්වන ලදී.<br>ඒ සඳහා මාණ්ඩලික නිලධාරීන් ද සහභාගී කරවා ගැනීමට ප්‍රධාන ලේකම් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |

## සැලසුම් අංශය

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | සැලසුම් අංශයට අනුයුක්තව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවය කරන නිලධාරීන් සඳහා උපකරණ මිලට ගැනීම. | ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කරන ලද, එම කාර්යාල වල සේවය කරනු ලබන අදාල නිලධාරීන් සඳහා අවශ්‍ය උපකරණ ලැයිස්තුව ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කරන ලද අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 40 සඳහා ඩෙස්ක්ටොප් පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර ලබා දීමට කටයුතු කරන මෙන් ප්‍රධාන ලේකම් උපදෙස් ලබා දෙන ලදී.<br>නිලධාරීන් සඳහා ලැප්ටොප් පරිගණක ලබා නොදීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇති බැවින්, එම ඉල්ලීම් සඳහා ද ඩෙස්ක්ටොප් පරිගණක ලබා දිය හැකි බව අදාල නිලධාරීන් දැනුවත් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |

## ඉංජිනේරු අංශය

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | බත්තරමුල්ල නව ගොඩනැගිල්ල තුල ප්‍රධාන ලේකම් කාර්යාලය ක්‍රියාත්මක මට්ටමින් ස්ථාපනය කිරීම. | නව පරිශ්‍රය වෙත යාමේ දී රැගෙන යන හා අපහරණය කළ යුතු භාණ්ඩ සම්බන්ධව මුල්‍ය චක්‍රලේඛයේ පරිදි ලැයිස්තුවක් සකස් කර, 2017.08.31ට පෙර එවන ලෙසත් භාණ්ඩ භාරව කටයුතු කරන නිලධාරීන් කැඳවා ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධව දැනුවත් කිරීම. මේ සඳහා කමිටුවක් ද යෝජනා කළ අතර, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන), නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය) හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) හා ප්‍රධාන අභ්‍යන්තර විගණක එම කමිටු සාමාජිකයින් ලෙස නම් කරන ලදී.<br>එම රැස්වීම, 2017.08.10 දිනට පෙර සංවිධානය කරන ලෙස දැනුම් දෙන ලදී. මෙම ක්‍රියාවලියේ දී විධිමත් ව භාණ්ඩ හුවමාරු විය යුතු බව ප්‍රධාන ලේකම් අවධාරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය) |
| 02. | පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ කළුතර කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම. | නව ගොඩනැගිල්ල සඳහා වන මිනින්දෝරු සැලැස්ම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලද බවත් මේ සතිය අවසන් වන විට ගොඩනැගිලි සැලැස්මේ අනුමැතිය ලැබීමට නියමිත බවත්, ඉන්පසු ප්‍රසම්පාදන කටයුතු ඇරඹිය හැකි බවත්, ආදායම් කොමසාරිස් විසින් ප්‍රධාන ලේකම් දැනුවත් කරන ලදී. | ආදායම් කොමසාරිස්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |

| | | | |
|---|---|---|---|
| 03. | බත්තරමුල්ල නව පරිශ්‍රය අසල ඇති බස් නැවතුම්පොළ ඉවත් කිරීම. | බත්තරමුල්ල නව පරිශ්‍රයේ වාහන ගාල් කිරීමේ ගැටලුවක් පවතින බැවින්, ඊට යාබදව ඇති බස් නැවතුම්පොළ ජයවඩනගම වෙත ගෙන යාම කෙරෙහි අවධානය යොමු කිරීම සහ ඒ සඳහා මාර්ග අංක 163 බස් මාර්ගයේ ගමනාන්තය දීර්ඝ කිරීම වෙනුවෙන් පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සමඟ සාකච්ඡාවක් කැඳවීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 04. | බස්නාහිර පළාත් සංවර්ධන සැලැස්ම ප්‍රගතිය නියාමනය කිරීම සඳහා අන්තර්ජාලය ආශ්‍රිත පරිගණක වැඩසටහනක් (Web based system) සකස් කිරීම. | ව්‍යාපෘතියක් අනුමත කිරීම, ප්‍රගතිය විමසීම ආදී කරුණු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කර ගැනීම සඳහා අන්තර්ජාලය ආශ්‍රිත පරිගණක වැඩසටහන සම්බන්ධව ITRDI ආයතනයේ අධ්‍යක්ෂ වෙතින් ප්‍රධාන ලේකම් විමසීමක් සිදු කළ අතර, ඒ පිළිබඳ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) සමඟ සාකච්ඡා කළ යුතු බව ප්‍රධාන ලේකම් ප්‍රකාශ කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |

.........................................
ඩබ්ලිව්.එම්. දයාවතී,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)

අත්/කලේ,
එම්.ඒ.බී. දයා සෙනරත්,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.